මාතලේ මහා නගර සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 18 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 26 දින ද නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මාතලේ මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමුච්චිත අරමුදලට බැරවිය යුතු රු.16,673,586 ක් හර කර තිබීම හා හර කළ යුතු රු.2,372,791 ක්, බැර කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදලේ ශේෂය රු.28,601,590 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අවිනිශ්චිත ගිණුමක් උපයෝගිකර ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ ගිණුම්වලින් නිවැරදි කර ඇත. |
| (ආ) | කසළ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරන අත්කරත්ත 26 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | මහා නගර සභාවට අයත් කඩ කාමර 5 ක් සහිත ඉඩමෙහි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | ඉඩම් ගොඩනැඟිලි ගිණුම්ගත කළ යුතු වේ. | අයිතිය නිරවුල් කරවාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් පොදු තැන්පත් ගිණුම් ශේෂය රු.42,156,034 ක් වුවත්, පොදු තැන්පත් ලේඛනයට අනුව එම ශේෂය රු.33,859,215 ක් වූයෙන් රු.8,296,819 ක අසමානතාවයක් විය. | අසමානතාවයන් හඳුනාගෙන ගිණුම් නිවැරදි කළ යුතු වේ. | දීර්ඝ කාලයක් තිස්සේ පවතින අසමානතාවයන් ඉදිරියේදී සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 1 ට වැඩි හා 5 ට අඩු රු.20,746,552 ක් හා වර්ෂ 5 ට වැඩි රු.11,684,262 ක් වූ ලැබිය යුතු ශේෂවලින්, 2020 ජූනි 10 දිනට තවදුරටත් රු.42,361,292 ක මුදලක් අයවිය යුතුව තිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 1 ට වැඩි හා 5 ට අඩු ගෙවිය යුතු ශේෂ රු.72,415,794 කින් 2020 ජූනි 10 දිනට රු.158,953,382 ක මුදලක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | තව දුරටත් ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.59,584,963 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂවලට අදාළ උප ලේඛන හා ලිපිගොනු පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. විස්තරාත්මක උපලේඛන හා ලිපිගොනු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | වටිනාකම රු. | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය හා 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය, V උපලේඛන - 1(v), 4(v), හා 6(v) | සම්ප්‍රේෂණ කුළුණු 15 ක් වෙනුවෙන් ගොඩනැඟිලි සැලසුම් අනුමත කර සංවර්ධන බලපත්‍ර ලබාදී නොතිබුණි. | 460,000 | නීති, රීති රෙගුලාසි ආදියට අනුකූලව කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් සොයාබලා ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (ආ) | 2015 මැයි 15 දිනැති අංක 1914/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය | | | | |
| | iv(අ) කොටස පළාත් සභා නිවේදනය 3(i) | සභාවේ අවසරය නොලබා සභා රැස්වීම්වලට සහභාගි වී නොතිබුණු සභිකවරුන් 20 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ දීමනා ගෙවා තිබුණි. | 1,070,000 | නොපැමිණීම විධිමත් ක්‍රමවේදයට අනුව දැනුම් දීම. | ගැසට් පත්‍රයේ 3 (1)1 හි සඳහන් සභාවේ අවසරය යන කොන්දේසිය සපුරාලීම මත මාසික දීමනා ගෙවා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මු. රෙ. 104 (3) හා (4) | වාහන 5 කට සිදුවී තිබූ අනතුරු සම්බන්ධව විධිමත් පරීක්ෂණ සිදුකර වගකිවයුත්තන් හඳුනාගෙන නොතිබුණි. | 2,913,481 | පරීක්ෂණ වාර්තා ලබාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පරීක්ෂණ මණ්ඩලයේ වාර්තා ලබාගෙන කඩිනමින් අවශ්‍යය ඉදිරි පියවර ගනිමි. |
| (ඇ) | 1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/119 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පරිබාහිරව කටයුතු කර සැලසුම් කම්ටු දීමනා ගෙවා තිබූ අතර, එම දීමනා පෙරසැරි ගාස්තු වලින් නොගෙවා සභා අරමුදලින් ගෙවා තිබුණි. | 191,000 | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | සැලසුම් කම්ටු දීමනා පෙරසැරි ගාස්තු ඉක්මවා නොයන පරිදි අදාළ වැය ශීර්ෂය මඟින් ගෙවා ඇති බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.64,769,012 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.99,916,360 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තු ගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිප නම් හා බදු | 45,000,000 | 36,673,649 | 24,963,721 | 28,403,873 | 36,722,000 | 36,384,186 | 36,615,594 | 24,248,573 |
| (ii) | කුලී | 20.000,000 | 13,696,558 | 12,641,502 | 2,138,883 | 13,100,000 | 13,404,418 | 12,782,147 | 3,803,086 |
| (iii) | බලපත්‍ර | 9,900,000 | 15,144,372 | 14,862,372 | 505,000 | 8,550,000 | 11,279,012 | 11,056,012 | 223,000 |
| (iv) | වෙනත් ආදායම් | 357,442,151 | 383,898,249 | 345,439,387 | 37,780,503 | 308,156,000 | 274,911,769 | 271,108,683 | 31,351,173 |
| | එකතුව | 432,342,151 | 449,412,428 | 397,906,982 | 68,828,259 | 366,528,000 | 335,979,385 | 331,562,436 | 59,625,832 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු හිඟ මුදල රු.10,000 ඉක්මවූ පෞද්ගලික දේපළ 283 කින් හා රාජ්‍ය ආයතන දේපළ 48 කින් මුළු හිඟ වරිපනම් පිළිවෙළින් රු.8,161,234 ක් හා රු.3,428,468 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2020 මැයි 31 දිනට පිළිවෙළින් රු.7,375,274 ක් හා රු.3,232,416 ක් තවදුරටත් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019.12.31 දිනට හිග මුදලින් පිළිවෙළින් රු.785,960 ක් හා රු.196,052 ක් 2020.05.31 දිනට අය කර ගෙන ඇත. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | <u>කඩ කාමර කුලී</u> | | |
| (අ) | වෙළඳ සංකීර්ණ 03 කට අයත් කඩ කාමර 13 කින් මාස 05 ත් වර්ෂ 14 ත් අතර කාලයක සිට පවතින රු.854,376 ක කඩ කාමර කුලී හා රු.25,000 ක එක්වන් මුදලක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට ලිපි යොමුකර ඇති අතර, ඒ සඳහා ඉදිරියේදී නීතිඥානුකූලව කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නාගොල්ලේ පිහිටි රූඩ් 01 පර්චස් 25.7 ක බිම් කොටස ගිවිසුම් මත පුද්ගලයින් 12 දෙනෙකුට 1988 වර්ෂයේදී දීර්ඝ කාලීනව බදු දී තිබූ අතර, බදුකරුවන් විසින් එහි අනවසරයෙන් ඉදිකිරීම් සිදුකර තිබුණි. මෙම කඩ කාමර සඳහා රු.31,280,000 ක බදු කුලී මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | මෙම භූමියෙහි අයිතිය මහා නගර සභාව සතු බවට තහවුරු වී ඇති බැවින්, පැවරුම් නියෝග ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරමි. |
| (ඇ) | ගොංහාවෙල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 3 ක හා සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 3 ක බදු කුලී සංශෝධනය කර ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු වේ. | ගිවිසුම් අලුත් කිරීම සඳහා ඒවායේ නව තක්සේරු වටිනාකම ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපි යොමුකර ඇත. |
| (ඇ) | අඹගහමුල වෙළඳ සංකීර්ණයේ හා ගොංහාවෙල නව හා පැරණි වෙළඳ සංකීර්ණවල කඩ කාමර 32 ක් මුද්‍රා තබා වසා දමා තිබුණි. | වසා දමා ඇති කඩකාමර බදු දීමට කටයුතු කළ යුතු වේ. | මිල ගණන් කැඳවා බදුකරුවන් තෝරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.28,946,963 ක් හා උසාවි දඩ රු.4,224,058 ක් අයවිය යුතුව තිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගත යුතු වේ. | අයවිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ අයකර ගැනිම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. |

2.2.5 අධිභාර

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 226 වගන්තිය අනුව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද රු.530,396 ක අධිභාර අයකරගෙන නොතිබුණි. | අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කැන්දගොල්ල පෞද්ගලික මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම සම්බන්ධව රු.20,396ක මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන අතර, බාහිර පාර්ශවයන්ට නිවාස සැපයීම හේතුවෙන් රු.510,000ක අධිභාරය සම්බන්ධයෙන් අභියාචනා කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂිකව එකතුකරනු ලබන පුනරාවර්තන ආදායම් රු.237,816,189 ක් බලප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා යොදවා ගැනීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | පුනරාවර්තන ආදායම් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා යොදවා ගත යුතු වේ. | නාගරික සංවර්ධන කටයුතු සඳහා ඉදිරියේදී එම මුදල් භාවිතා කිරීමේ හැකියාව ඇති බව දන්වමි. |

(ආ) <u>අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාතලේ නගර මධ්‍යයේ පිහිටි උද්‍යානය සහිත ඉඩමේ අයිතිය සනාථ වන නීතිමය ලියවිල්ලක් මහා නගර සභාව සතු නොවූ අතර, උද්‍යානයට අයිතිව තිබූ අක්කර 6 ක් පමණ ප්‍රමාණයක් වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබුණි. 2016 වර්ෂයේ රු.7,692,264 ක් වැයකරමින් උද්‍යානය සංවර්ධන කටයුතු සිදුකර ඇතත්, කිසිදු සංචාරක ආකර්ශණීය බවක් උද්‍යානය තුළ දක්නට නොතිබුණි. පසුගිය වර්ෂ 4 ක උද්‍යානයේ පුනරාවර්තන වියදම් රු.13,737,217 ක් වී තිබූ අතර, එකී කාලය තුළ උපයා ඇති ආදායම රු.4,253,150 ක් විය. | සංචාරක ආර්ෂණීය ස්ථානයක් ලෙස පවත්වා ගැනීම හා පාරිසරික වටිනාකමක් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උද්‍යානයේ අලංකරණ කටයුතු මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදුකිරීමට සැලසුම් කළ නිසා මහා නගර සභාව ඒ සම්බන්ධව කටයුතු සිදු නොකරන ලදී. |

(ඇ) <u>අත්හැර දැමූ කර්තව්‍යයන්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.31,500,000 ක මුදලකට ඇස්තමේන්තු කර තිබූ ව්‍යාපෘති 6 ක් ඉටුකර නොතිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන නිසි සැලැස්මකින් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. | මෙම ව්‍යාපෘති මහා සභාවේ අනුමත නොවීම, ඉඩම්වල ගැටළු පැවැතීම හා වෙනත් ආයතන මඟින් එම ව්‍යාපෘති ඉටු නොවීම මීට හේතුවී ඇත. |

(ඈ) <u>කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මාතලේ එම්.සී. පාරේ පිහිටි මහා නගර සභාවට අයත් ඉඩම්වල අනවසර පදිංචිකරුවන් 130 දෙනෙකු වර්ෂ 40 ක පමණ කාලයක සිට පදිංචිව සිටින අතර, එම ඉඩම් අදාළ පදිංචිකරුවන් වෙත දීර්ඝ කාලීනව බදුදීම සඳහා ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ඉඩම සඳහා අයිතිය සනාථ කර ගැනීමේ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි. | ඉඩම්වල අයිතිය සනාථ කර පදිංචිකරුවන්ට අයිතිය පැවරීමේ කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඉ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | මාසිකව එකතුකරන දිරන කසළ ටොන් 405 න් හා නොදිරන කසළ ටොන් 106 න් ටොන් 210 ක් පමණ කාබනික පොහොර නිපදවීමට යොදාගෙන ඉතිරි කසළ පෞද්ගලික ඉඩමකට අවිධිමත් ලෙස බැහැර කරමින් තිබුණි. මේ සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. මේ හේතුවෙන් බාහිර පාර්ශවයන් විසින් මහා නගර සභාවට එරෙහිව නඩු පවරා තිබූ අතර, 2019 අගෝස්තු 21 දින වන විට නඩු ගාස්තු ලෙස රු.4,585,986 ක මුදලක් සභාවට වැයකිරීමට සිදුව තිබුණි. මේ නිසා කසළ බැහැර කිරීම සම්බන්ධව ඉදිරියේදී අවිනිශ්චිත තත්ත්වයක් පැවතුණි. | ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීම. පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම හා කාබනික පොහොර නිපදවීම වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. | කසළ වර්ගීකරණය කර එකතු කරන අතර, ගෘහස්ථ කොම්පෝස්ට්කරණය විධිමත් කිරීම සඳහා කොම්පෝස්ට් බැරල් 800 ක් ලබාදී ඇත. නොදිරණ කසළ වෙන්කිරීම සඳහා මධ්‍යස්ථානයක් අරඹා ඇත. කසළවල සංයුතිය පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ඇත. දිනකට දිරණ කසළ ටොන් 7.4 ක් එකතු කරයි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මහා නගර සභාවේ කසළ බැහැර කිරීමේ ගැටළුවට විසඳුමක් වශයෙන් විහාරගමවත්ත ප්‍රදේශයේ අක්කර 5 ක් සහිත ඉඩමක් රු.2,000,000 ක් වැයකර 2010 වර්ෂයේ මිලදීගෙන, එහි සනීපාරක්ෂක කසළ බිම් පිරවුම් මූලික ශක්‍යතා හා සැලසුම් සකස් කිරීම සඳහා රු.400,000 ක් වැයකර ඇතත්, කසළ බැහැර කිරීමට නොහැකිව එකී ඉඩම නිශ්කාර්යව පැවතුණි. | ඉඩම අරමුණුගත කාර්යයකට යොදවා ගැනීමට නොහැකි නම්, සුදුසු ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීමට හා මිලදී ගැනීම් සිදුකළ නිලධාරීන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඊ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ----------- | ------------------------------ |
| මාතලේ මහා නගර සභා බලප්‍රදේශයේ නිවැසියන්, ව්‍යාපාර ස්ථාන හා පොදු ආයතනවල අපජලය පොදු කානුවලට මුදාහැරීම හා වැසිකිළි මළ ද්‍රව්‍ය ජල මාර්ගවලට මුදාහැරීම සහ මාතලේ මහ රෝහලේ පල්දෝරු පද්ධතිය අක්‍රීය වී තිබීම හේතුවෙන් ස්වභාවික ජල තීරයට සිදුවන බලපෑම පාලනය කිරීම සඳහා විය යුතු මැදිහත්වීම හා නියාමනය ප්‍රමාණවත් නොවන බව සම්බන්ධ පරිසර විගණන වාර්තාව 2020 පෙබරවාරි 27 දින ආණ්ඩුකාරවරයා වෙත නිකුත් කර තිබුණි. | අපජල බැහැර කිරීම සඳහා විධිමත්, දීර්ඝ කාලීන සැලැස්මක් පිළියෙල කිරීම, නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කිරීම, ඒවා වැඩිදියුණු කිරීම හා ස්වභාවික ජල තීරයට සිදුවන හානිය අවම කිරීම. | ව්‍යාපාරික ස්ථාන, නිවාස හා ආයතනවල අපජලය පිළිබඳ සියලුම ස්ථානීය පරීක්ෂාවන් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. |

(උ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ----------------------------- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විධිමත් පරිදි දැනුවත්ව නොතිබීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2020 අප්‍රේල් 30 දින වන විටත් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | මහා නගර සභා ආඥා පනත අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන රජයේ අරමුණු ඉටුවන පරිදි සැලසුම් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂ 5 ක කාලය තුළ ඉදිරිපත් වූ ගොඩනැගිලි අයදුම්පත්‍ර 1325 කින් 848 ක් අනුමත කර ඇතත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ 189 ක් සඳහා පමණි. මෙම කාලය තුළ අනුමත නොකළ ගොඩනැගිලි අයදුම්පත්‍ර පිළිබඳව පසුවිපරම් සිදුකර නොතිබුණි. | නීති,රීති, රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතු වේ. | අනුකූලතා සහතික ලබා ගැනීමටත් බලපත්‍රවල වලංගු කාලය දිර්ඝ කර ගැනීමට අදාළ පාර්ශවයන්ට ලිඛිතව දැනුවත් කර ඇත. |
| (ආ) | මහා නගර සභාවට අයත් අක්කර 87 රූඩ් 02 පර්චස් 33.34 ක් වූ ඉඩම් කැබලි 25 ක් සඳහා මැනුම් කටයුතු සිදුකර පිඹුරුපත් ලබාගෙන තිබුණද, හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි. මීට අමතරව ප්‍රමාණය හඳුනාගත නොහැකි ඉඩම් කැබලි 25ක් සඳහා අයිතිය සනාථකර ගැනීම සඳහා කිසිදු ලේඛනගත සාක්ෂියක් නොතිබුණි. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ඉඩම් සඳහා පැවරුම් නියෝග ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති අතර, පැවරුම් ලබා ගැනීමෙන් පසු මහා නගර සභා ආඥා පනතේ 252 අධිකාරියේ 36.1(iii) වගන්තිය ප්‍රකාරව කටයුතු කරමි. |
| (ඇ) | 2006 ජනවාරි 31 දිනැති සභා තීරණය අනුව හිග්ගොල්ල නිවාස ව්‍යාපෘතියට අදාළව අනවසර පදිංචිකරුවන් 104 දෙනෙකු සඳහා බිම් කොටස් දීර්ඝ කාලීනව බදු පදනම මත ලබාදීමට තීරණය කර තිබුණි. එහෙත් මෙම ඉඩම්වල අදාළ අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 36(1)(iii) හා 40(ඊ)(i) වගන්තීන් ප්‍රකාරව ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | පනතේ විධිවිධාන අනුගමනය කිරීම හා පදිංචිකරුවන්ට නීත්‍යානුකූල භාවයක් ලබාදීම. | අයිතිය මහා නගර සභාව සතු වූ බව තහවුරු වී ඇති බැවින් අදාළ ඉඩම් සඳහා පැවරුම් නියෝග ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවා ඇත. අදාළ පැවරුම් ලබා ගැනීමෙන් පසු මහා නගර සභා ආඥා පනතේ 252 අධිකාරියේ 36.1(iii) වගන්තිය ප්‍රකාරව කටයුතු කරමි. |
| (ඇ) | පදික වෙළඳාම නතර කිරීමේ අරමුණු සහිතව අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මාතලේ දුම්රියපොල ගබඩාව ගිවිසුම් ගතවීමකින් තොරව මහා නගර සභාවට බද්දට ගෙන තිබූ අතර රු.4,970,721 ක් පමණ වැයකර නවීකරණය කර මහා නගර සභාව විසින් වෙළෙඳුන්ට බද්දට දී තිබුණි. පසුව එම ස්ථානයෙන් වෙළඳුන් ඉවත්කර 2019 මාර්තු 12 දින මහා සභා තීරණයක් | සභා අරමුදලට සිදුවූ පාඩුව හා හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධව කටයුතු කළ යුතු වේ. | රු.393,400 ක කුලී මුදලින් 2020.06.10 වන විට අයවී ඇති මුදල රු.206,000 වන අතර ඉතිරි මුදල වන රු.187,400 ක මුදල අයකර ගැනීම සඳහා ඉදිරියේදී නිත්‍යානුකූලව කටයුතු කරන බව දන්වමි. |

මත එම ගබඩාව දුම්රිය දෙපාර්තමේන්තුවට ආපසු භාරදී තිබුණි. මේ හේතුවෙන් නැවතත් වෙළඳුන්ට පදික වේදිකාවේ වෙළඳාම් කිරීමට සිදුව තිබූ අතර ගබඩාව නවීකරණය කිරීමට වැයකළ රු.4,970,721 ක මුදල ද නිශ්ඵල වී තිබුණි. තවද 2019 අප්‍රේල් 10 දින වන විට දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.667,740 ක බදු කුලියක් හිඟව තිබූ අතර වෙළඳුන් 43 දෙනෙකුගෙන් ලබාගෙන තිබුණු රු.249,000 ක ඇප මුදලක් නිදහස්කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) (i) | බඳවා ගැනීම් පරිපාටියකින් තොරව සේවකයින් 40 දෙනෙකු බඳවාගෙන නගරාධිපතිවරයා විසින් පත්වීම් ලබාදී තිබුණි. මෙම සේවකයන් තෝරාගත් ආකාරය පැහැදිලි නොවූ අතර එලෙස බඳවාගත් සේවකයින් වෙනුවෙන් 2018 දෙසැම්බර් මස සිට 2019 මාර්තු දක්වා රු.1,511,606 ක වැටුප් ගෙවා තිබුණි. | විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් යටතේ කටයුතු කළ යුතු වේ. | ගරු නගරාධිපතිතුමා බඳවාගත් සේවකයින්ගේ පත්වීම් 2019.12.31 දින අත්හිටුවා ඇති අතර, සේවකයින් උපයන ආදායමින් දීමනා ගෙවා ඇත. |
| (ii) | රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබාදීමට කටයුතු නොකර සේවකයින්ගෙන් අයකරගත් රු.179,690 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | නීත්‍යානුකූල ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු වේ. | අදාළ මුදල් ඔවුන් වෙත ගෙවීමට හෝ රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට කඩිනමින් කටයුතු කරමි. |
| (iii) | නගරාධිපතිවරයා ලබාදී තිබූ තාවකාලික පත්වීම් 2019.03.31 දින අවලංගු කර නැවත 2019 අප්‍රේල් 09 හා 25 දිනයන්හි කොමිස් ගෙවීමේ පදනම මත පත්වීම් ලබාදී තිබුණි. | නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් පත්වීම් අවලංගු කර ඇත. |
| (ආ) | පුවත්පත් දැන්වීමට අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරා නොතිබූ සෞඛ්‍ය කම්කරුවන් 17 දෙනෙක් බඳවාගෙන ඇතත් සියලු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් 04 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවිධිමත් ක්‍රමවේදයක් තුළින් බඳවා ගැනීම සම්බන්ධව වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පුවත්පත් දැන්වීමට පරිබාහිරව නාගරික කොමසාරිස් විසින් කටයුතු කර, සම්මුඛ පරීක්ෂණය පවත්වා පත්වීම් ලබාදී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කම්කරුවන් හා සෞඛ්‍ය කම්කරුවන් 44 දෙනෙකු වගකිවයුතු කාර්යාලගත තනතුරුවල හා මුරකරු, රියදුරු වැනි සේවාවන්වල සේවයේ යොදවාගෙන තිබුණි. | කම්කරු සේවකයින් නිත්‍ය සේවාවල යෙදවීම. | කාර්යාලගත සේවාවන්වල පුරප්පාඩු හා අනුමත සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම මත, කම්කරුවන් සේවයේ යොදවාගෙන ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු 31 ක පුරප්පාඩු 107 ක් පැවතුණු අතර, එදිනට අනුමත නොවූ තනතුරු 4 ක් ඇතුළුව 6 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු වූ තනතුරු සම්පූර්ණ කරවාගත යුතු අතර, අතිරික්ත තනතුරු සම්බන්ධව නිසි ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතු වේ. | සභා පුරප්පාඩු ඉදිරියේදී ගැසට් කර පිරවීමටත් අනෙකුත් පුරප්පාඩු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් සම්පූර්ණ කරදෙන ලෙසත් දන්වා යවා ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තාවකාලික පදනම මත බඳවාගෙන පසුව සේවය ස්ථිර කරන ලද සේවකයින් 90 කගෙන් අයකරගත් දායක මුදල් හා සභා දායක මුදල් රු.8,352,228 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | සේවකයින්ගෙන් අයකරගත් දායක මුදල් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | චක්‍රලේඛ උපදෙස් අනුව තාවකාලික පදනම (අනියම්) මත සේවය කළ කාලසීමාව විශ්‍රාම වැටුප් ගණනයට එකතු කරන්නේ නම් ඔවුන්ට අදාළ සභා දායක මුදල ප්‍රේෂණය කිරීමට රඳවාගෙන ඇත. |
| (ආ) | රු.491,080 ක අත්තිකාරම් මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අත්තිකාරම් ශේෂ දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන බැවින් කඩිනමින් සොයා බලා නිරවුල් කිරීමට අවශ්‍යය කටයුතු කරමි. |
| (ඇ) | එකතු කළ අගය මතු බදු (VAT) රු.7,818,300 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු රු.1,022,000 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමකින් තොරව රඳවාගෙන තිබුණි. | කඩිනම් ක්‍රියාමර්ග ගැනීමට කටයුතු කළ යුතු වේ. | කඩිනමින් ප්‍රේෂණය කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 2012 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත සමාලෝචිත වර්ෂයට වරිපනම් අයකර තිබුණි. | තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු වාර්තාවක් ලබා දෙන ලෙස තක්සේරු දෙපාර්තමේනතුව වෙත දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මහා නගර සභාවේ යාන්ත්‍රික වැඩපල වර්තමානය වන විට අක්‍රිය තත්ත්වයට පත්කර තිබුණි. | යාන්ත්‍රික වැඩපල සක්‍රීය කර කාර්යසාධනය ඉහළ මට්ටමකට ගෙන ඒමට කටයුතු කළ යුතු වේ. | යාන්ත්‍රික වැඩපළෙහි කටයුතු යථා තත්වයට පත්කිරීමට ඉදිරියේදී පියවර ගැනීමට කටයුතු කරමි. |

3.5 වත්කම් කළමනාකරණය
------------------------------

නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.4,317,500 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි 3 ක්, වාහන 3 ක්, යන්ත්‍රෝපකරණයක් හා වටිනාකම හඳුනා නොගත් ඉඩම් හා ගොඩනැගිලි 2 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා කර භාවිතයට ගතහැකි වාහන භාවිතයට ගැනීමටත් අනිකුත් වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | අපහරණ ක්‍රියාවලියට ලක් කරන ලද වාහන අපහරණය නොකිරීමට මහා සභාව තීරණය කළ අතර, එක් වාහනයක් වෙන්දේසියේදී අලෙවි නොවීම නිසා ඉදිරියේදී භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

3.6 ආර්ථික නොවූ ගනුදෙනු
----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනවසර වෙළඳසැල් 6 ක් 2018 ජුලි 19 දින කඩා ඉවත් කර ඇතත්, ඉන් මාස 10 ක් ගතවීමෙන් අනතුරුව සභා අනුමැතියකින් තොරව දෛනිකව රු.500 ක කුලියක් ලබාගෙන පාර්ශවකරුවන් 4 කට වෙළඳසැල් පවත්වා ගැනීමට නගරාධිපතිවරයා විසින් ඉඩකඩ ලබාදී තිබුණි. | අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතු වේ. | අනවසර වෙළඳසැල් 6 සභා තීරණය මත ඉවත් කර ඇතත්, ගරු නගරාධිපතිතුමා විසින්, තෝරාගත් බදු කරුවන් වෙත නැවත එම කඩ කාමර බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කර ඇත. |

3.7 අවිධිමත් ගනුදෙනු

---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | ----------------------------- |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් හා බදු කුලී ගාස්තු තක්සේරු කිරීමකින් තොරව හා අවිධිමත්ව කටයුතු කර සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ ත්‍රිමාන සිනමා ශාලාවක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා රු.82,000 ක මාසික බදු කුලියකට වර්ෂ 10 ක් සඳහා ගිවිසුම්ගතව බාහිර පාර්ශවයකට බද්දට ලබාදී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වේ. | එක් ලංසුකරුවකු පමණක් ඉදිරිපත් වී ඇති අතර ලංසු ඇගයීම් කමිටුවේ හා සභා තීරණයන් අනුව කොන්ත්‍රාත්තුව අදාළ එම ලංසුකරුට පිරිනමා ඇත. |
| (ආ) | මහා නගර සභාව ඉදිරිපිට හා අඹගහමුල බස් නැවතුම්පල අසළ අධිතාක්ෂණික සම්ප්‍රේෂණ කුළුණු 02 ක් 2018 වර්ෂයේ අනවසරයෙන් ඉදිකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විධිමත් හා නීත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වේ. | අධි තාක්ෂණික සම්ප්‍රේෂණ කුළුණු 02 ක් සම්බන්ධව කරුණු සොයා බලා ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ) | පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු තම ව්‍යාපෘති අංගනය පවත්වාගෙන යාම සඳහා 2018 වර්ෂයේ දී මහා නගර සභාවට අයත් අක්කරයක විශාලත්වයකින් යුතු පාරාවත්ත ඉඩම පරිහරණය කර සිදුකළ ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි. | අනවසර කටයුතු සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | මහා නගර සභා පොදු වැසිකිළි 2 ක් මහා නගර සභාවේ කම්කරුවන් දෙදෙනෙකු විසින් වෙනත් පාර්ශවයන් යොදවා අනවසරයෙන් පවත්වාගෙන යමින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මහජනතාවගෙන් එකතුකරන ලද රු.462,880 ක මුදලක් අවභාවිතා කර තිබුණි. | අක්‍රමිකතාවයන් සම්බන්ධ නිසි ක්‍රියාමාර්ග ගැනීම හා වැසිකිළි සම්බන්ධ නිසි කළමනාකරණයක් පවත්වා ගත යුතු වේ. | දැනට සියලුම පොදු වැසිකිළි මහා නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ ආදායම් පරීක්ෂකවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාමට කටයුතු යොදා ඇත. |
| (ඉ) | අඹගහමුල වෙළඳ සංකීර්ණයේ දෙවන ගොඩනැඟිල්ලේ බිම් මහල තුළ අනවසර කඩ ඉදිකිරීම සිදුකර තිබූ අතර, අංක 10 කඩය තුළ අනවසර මාළු වෙළඳසැලක්ද පවත්වාගෙන යමින් පැවතුණි. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම හා නිතිමය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් කර නීතිමය කටයුතු සිදුකරමි. |

## 3.8 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ දෙවැනි හා තෙවැනි මහල බදුදීම සඳහා බදුකරුවන් 18 දෙනෙකු තෝරාගෙන රු.1,004,587 ක ඇප තැන්පතු ද ලබාගෙන ඇතත් කඩ කාමර ඉදිකර බදු දීමට කටයුතු කර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දින සිට 2019 ජූනි 30 දින දක්වා කාලය තුළ ලබාගත හැකිව තිබූ රු.10,237,500 ක කුලී ආදායමක් ද අහිමි වී තිබුණි. | තෝරාගත් බදුකරුවන්ට කඩකාමර පැවරීමට කටයුතු කිරීම හා අලාභයන් සම්බන්ධව වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනීම කළ යුතු වේ. | ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවන ආකාරයෙන් කටයුතු කිරීමට අවශ්‍යය පියවර ගෙන ඇත. |
| (ආ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සේවකයින් 18 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. පසුව 2015 සැප්තැම්බර් 23 දිනැති සභා තීරණයෙන් එම පත්වීම් අවලංගු කර තිබීම හේතුවෙන් අදාළ සේවකයින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා, නඩු තීරණයට අනුව සේවකයින්ට නැවත ස්ථිර පත්වීම් ලබාදීමට සිදුවී තිබුණි. මේ හේතුවෙන් නඩු කටයුතු සඳහා වැය කළ රු.250,000 ක මුදල සභා අරමුදලට පාඩුවක් වී තිබුණි. | නඩු ගාස්තු අයකර ගැනීමේදී අවිධිමත්ව බඳවා ගැනීම් සිදුකළ පාර්ශවයන් කෙරෙහි අවධානය යොමු කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018.12.06 දිනැති අංක 06:1:01:59 දරණ මහා සභා තීරණය අනුව, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/2015/2017 දරන නඩුවේ නීතිඥ ගාස්තු ලෙස නගර සභාව ගෙවා ඇති මුදල් පැමිණිල්ල ගොනුකළ පත්වීම් ලාභීන්ගෙන් අයකර ගැනීමට තීරණය කර ඇත. |
| (ඇ) | දැන්වීම් පුවරු ලේඛනයේ ඇතුළත් පුවරුවල ප්‍රමාණය හා භෞතික පරීක්ෂාවේදී ගන්නා ලද මිනුම්වල ප්‍රමාණයන් අතර, වෙනස්කම් හේතුවෙන්, අඩුවෙන් අයකර ඇති මුදල රු.263,875 ක් විය. | දැන්වීම් පුවරු නිශ්චිතව හඳුනාගෙන ගාස්තු අය කරගත යුතු වේ. | 2018 වර්ෂය තුළ නගරසභා සීමාව තුළ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු සංඛ්‍යාව හා ඒවායේ වර්ග අඩි ප්‍රමාණයන් මත ගාස්තු අයකර ඇත. |
| (ඈ) | රුපියල් මිලියන 24 කට ආසන්න මුදලකට කසළ දාහකයක් මිලදී ගැනීමේදී තාක්ෂණ ක්‍රමවේදයකින් තොරව අවිධිමත්ව පිළියෙල කළ පිරිවිතරයන් හේතුවෙන් ලැබී තිබූ මිල ගණන් සැසඳීම තාක්ෂණ ඇගයීම් කමිටුව ප්‍රතික්ෂේප කර තිබීම මත පුවත්පත් දැන්වීම් වෙනුවෙන් වැයකර තිබූ රු.121,193 ක මුදල පාඩුවක් වී තිබුණි. | විධිමත් තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කිරීම හා අලාභයන් සම්බන්ධ වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරිපත් කළ සියලුම ආයතන කැඳවා අදාළ නිෂ්පාදනය පිළිබඳව තාක්ෂණික ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී. එම ඉදිරිපත් කිරීම් අනුව කසළ දාහකය මිල දී ගැනීම සුදුසු නොවන බවට නිර්දේශ කර ඇත. |

## 3.9 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 හා 2019 වර්ෂවල වාහන පාලක සේවකයින් වෙත ලබාදීම සඳහා ආදායම් අංශයේ නිලධාරීන් තුන්දෙනෙකු වෙත ගබඩාවෙන් නිකුත් කළ රු.234,000 ක් වටිනා රිසිට් පොත් 52 ක් ආපසු භාරදීමට කටයුතු කර නොතිබුණි. | අදාළ රිසිට් පොත් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | රිසිට් පොත්වලට අදාළ මුදල් අය කරගනිමින් හා ඔවුන් භාවිත කළ රිසිට් පොත් සියල්ල කාර්යාලයට ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

## 3.10 ප්‍රසම්පාදනය

### 3.10.1 සැපයුම් හා සේවා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 9 දෙනෙකුගෙන් රු.28,837,085 ක් වටිනා ව්‍යාපෘති 34 ක් ඉටු කිරීම සඳහා මිල ගණන් කැඳවා තිබුණි. කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකු අවිධිමත්ව සන්ධානගතව ඇස්තමේන්තු අගයකට වඩා වැඩි මිල ගණන්වලට කොන්ත්‍රාත් අයදුම්කිරීමේ අක්‍රමිකතාවයක් සිදුකර ඇතත්, එම කොන්ත්‍රාත්කරුවන්ටම ඉදිකිරීම් පවරා තිබුණි. | අක්‍රමිකතාවයන් වළක්වා ගැනීමට කටයුතු සිදු කළ යුතු වේ. | මිල ගණන් ඉදිරිපත් කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් සන්ධානගතව ඇස්තමේන්තු අගයට වඩා වැඩි මිල ගණන්වලට කොන්ත්‍රාත් අයදුම් කිරීම අප ආයතනයට පාලනය කළ නොහැකි කාරණයක් වන බැවින් සම්මත අතුරු ව්‍යවස්ථාව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව අප කටයුතු කර ඇත. |

### 3.10.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මාර්ග 4 ක් සඳහා අවස්ථා 32 කදී ටිපර් රථවල කෝල්ඩ් මික්ස් ප්‍රවාහනය කර ඇතත්, බර මැනීම සිදුකර තිබුණේ අවස්ථා 4 කදී පමණි. ඉන් අවස්ථා 3 ක්ම නගර සභාවේ අධීක්ෂණයකින් තොරව සැපයුම්කරු සිදුකර තිබූ අතර, එම අවස්ථාවල ශුද්ධ බර ප්‍රමාණයන් කිලෝ ග්‍රෑම් 15275 ක්, 15130 ක් හා 15190 ක් විය. නමුත් නගර සභාව අහඹු ලෙස පරීක්ෂාකර තිබූ අවස්ථාවේ කෝල්ඩ් මික්ස්වල ශුද්ධ බර | අවිධිමත්ව කටයුතු කළ පාර්ශවයන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරියේදි ඉදිකිරීම් කටයුතු සඳහා කෝල්ඩ් මික්ස් ගෙන්වා ගැනීමේදී අහඹු ලෙස බර කිරා ගැනීමට සැලසුම් කර ඇති බව සඳහන් කරමි. |

කිලෝග්‍රෑම් 9740 ක් වී තිබුණි. ඒ අනුව මිලදීගත් බවට දක්වා තිබූ කොල්ඩ් මික්ස් මෙට්‍රික් ටොන් 460 ක ප්‍රමාණය නිවැරදිව ලැබුණු බවට තහවුරුවක් ලබාගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------
පිළිතුරු නොදුන් විගණන විමසුම්
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට මහා නගර සභාව වෙත ඉදිරිපත් කර තිබුණු විගණන විමසුම් 14 කට පිළිතුරු සපයා නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.96,726,792 ක් විය. | පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. |